AL/2022(2023)/32/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

**ව්‍යාපාර අධ්‍යයනය I**
வணிகக் கல்வி I
Business Studies I

**32 S I**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ※ **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ※ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ※ ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ..........................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| **ප්‍රශ්න අංක** | **ලකුණු** |
| **01 - 30** | |
| **31 - 50** | |
| **එකතුව** | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**1.** මිනිසා විසින් අනිවාර්යයෙන් ම සපුරාගත යුතු කායික හා මානසික තත්ත්ව හඳුන්වනු ලබන්නේ,

(1) උවමනා ලෙස ය. (2) භාණ්ඩ ලෙස ය. (3) අවශ්‍යතා ලෙස ය.
(4) ඉල්ලුම ලෙස ය. (5) වටිනාකම් ලෙස ය. (......)

**2.** 'නිෂ්පාදනයේ ස්වභාවය' මත කෙරෙන වර්ගීකරණයට අයත් ව්‍යාපාර අංශයක් වන්නේ,

(1) තනි ව්‍යාපාර ය. (2) පොදු ව්‍යාපාර ය. (3) වරලත් ව්‍යාපාර ය.
(4) ප්‍රාථමික ව්‍යාපාර ය. (5) කාර්මික ව්‍යාපාර ය. (......)

**3.** ඇල්ෆා සමාගම පිරිවැය කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ ක්‍රම අධ්‍යයනය කිරීම තුළින් හා අමුද්‍රව්‍ය දෛනිකව මිල දී ගැනීම මගින් තත්ත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය කරයි. තවද සමාගම, නව තාක්ෂණික උපායමාර්ග තුළින් නවෝත්පාදන අවස්ථා පිළිබඳ ව අඛණ්ඩව සැලකිලිමත් වේ. ඉහත සිද්ධියේ ඇතුළත් පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් ගණන,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

**4.** භාණ්ඩයක ඇති සුවිශේෂී අනන්‍යතාවය හේතුකොට ගෙන පාරිභෝගිකයෙක් එම භාණ්ඩය කෙරෙහි ඇල්මක් දක්වන්නේ නම් එය,

(1) පහසු භාණ්ඩයකි. (2) නොසෙවූ භාණ්ඩයකි. (3) සාප්පු භාණ්ඩයකි.
(4) පෞද්ගලික භාණ්ඩයකි. (5) විශේෂ භාණ්ඩයකි. (......)

**5.** පහත වගුවේ දැක්වෙන්නේ ජාත්‍යන්තර සංවිධාන කිහිපයක් සහ ඒවාට අයත් සාමාජික රටවල් කිහිපයකි.

| **ජාත්‍යන්තර සංවිධාන** | **සාමාජික රටවල්** |
|---|---|
| (i) යුරෝපීය සංගමය (EU) | A - සයිප්‍රස් |
| (ii) අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN) | B - ජපානය |
| (iii) ජී 8 (G 8) | C - උගන්ඩාව |
| (iv) දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය (SAARC) | D - ලාඕසය |
| (v) අප්‍රිකානු සංගමය (AU) | E - ඇෆ්ගනිස්ථානය |

ඉහත දී ඇති ජාත්‍යන්තර සංවිධානවල අනුපිළිවෙළ අනුව ඊට අදාළ සාමාජික රටවල් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, D, B, E, C (2) A, E, C, B, D (3) C, B, E, A, D
(4) C, E, B, A, D (5) D, A, B, E, C

(......)

[දෙවැනි පිටුව බලන්න.

PaperKokka.lk

**6.** ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

ප්‍රකාශය **A** : අභ්‍යන්තර පරිසර විශ්ලේෂණය තුළින් ව්‍යාපාරයක ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැක.

ප්‍රකාශය **B** : කර්මාන්ත පරිසර විශ්ලේෂණය තුළින් ව්‍යාපාරයකට ඇති අවස්ථා හා තර්ජන හඳුනාගත හැක.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,

(1) **A** පමණක් සත්‍ය වේ.
(2) **B** පමණක් සත්‍ය වේ.
(3) **A** හා **B** දෙකම සත්‍ය වේ.
(4) **A** හා **B** දෙකම අසත්‍ය වේ.
(5) **A** සත්‍ය වන අතර **A** මගින් **B** පැහැදිලි කෙරේ. (……)

**7.** ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම හිතකරව බලපාන ව්‍යාපාර යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඉදිකිරීම්, සංචාරක
(2) මෝටර් රථ, සංචාරක
(3) මෝටර් රථ, තේ
(4) ඉදිකිරීම්, තේ
(5) සංචාරක, තේ (……)

**8.** 'තිරසරභාවය' යනු,

(1) පාරිසරික, ආර්ථික සහ සාමාජීය බලවේග පිළිබඳ කෙටිකාලීන දැක්මයි.
(2) පාරිසරික, ආර්ථික සහ සංස්කෘතික බලවේග පිළිබඳ දිගුකාලීන දැක්මයි.
(3) පාරිසරික, දේශපාලන සහ සාමාජීය බලවේග පිළිබඳ කෙටිකාලීන දැක්මයි.
(4) පාරිසරික, ආර්ථික සහ සාමාජීය බලවේග පිළිබඳ දිගුකාලීන දැක්මයි.
(5) පාරිසරික, සංස්කෘතික සහ දේශපාලන බලවේග පිළිබඳ දිගුකාලීන දැක්මයි. (……)

**9.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන මගින් සිදු **නොකරන** සේවාවක් වන්නේ,

(1) කැලි කසළ ඉවත් කිරීම ය.
(2) මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ය.
(3) පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ය.
(4) වරිපනම් එකතු කිරීම ය.
(5) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම ය. (……)

PaperKokka.lk

**10.** ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බදු වර්ග කිහිපයක් පහත දැක්වේ.

A – නිෂ්පාදන බදු
B – සමාගම් බදු
C – අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APTI)
D – එකතු කළ අගය මත බදු
E – සමාජ ආරක්ෂණ බදු
F – ප්‍රාග්ධන ලාභ මත බදු
G – රඳවා ගැනීමේ බදු

ඉහත දෑ අතුරෙන් සෘජු බදු පමණක් දැක්වෙන කාණ්ඩය කුමක් ද?

(1) A, B, D, E
(2) A, C, E, F
(3) B, C, F, G
(4) C, D, E, G
(5) C, E, F, G (……)

**11.** මුදල් ප්‍රතිපත්ති උපකරණ කිහිපයක් පහත දැක්වේ.

A – බැංකු අනුපාතිකය
B – ශිෂ්ඨ ප්‍රයෝග (Moral suasion)
C – විවෘත වෙළඳපොළ කටයුතු
D – ආන්තික අවශ්‍යතා
E – ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය
F – ප්‍රතිමූල්‍ය පහසුකම්

ඉහත දෑ අතුරෙන් ප්‍රමාණාත්මක මුදල් ප්‍රතිපත්ති උපකරණ පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, C (2) A, C, E (3) B, D, E (4) C, D, E (5) C, E, F (……)

**12.** ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ගීකරණ නිර්ණායකයක් **නොවන්නේ**,

(1) සේවක සංඛ්‍යාව ය.
(2) නිෂ්පාදන පරිමාව ය.
(3) යෙදවූ ප්‍රාග්ධනය ය.
(4) වාර්ෂික පිරිවැටුම ය.
(5) ලාභ ආන්තිකය ය. (……)

[තුන්වැනි පිටුව බලන්න.

**13.** කේවල ස්වාමි ව්‍යාපාර සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(2) විගණනය කිරීම අනිවාර්ය වේ.
(3) ආදායම් බදු ගෙවීම අනිවාර්ය වේ.
(4) පළාත් පාලන රෙගුලාසිවලට අවනත වීම අනිවාර්ය වේ.
(5) කළමනාකරණයට පවුලේ සාමාජිකයන්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ. (......)

**14.** ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සමාගම විසින් ලාභ බෙදාහැරීමක් නොකිරීම
(2) අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව එක් අයෙකුට සීමා වීම
(3) අවම වශයෙන් කොටස්කරුවන් දෙදෙනෙකුවත් සිටිය යුතු වීම
(4) කොටස් සහ සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම
(5) ව්‍යාපාරික පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කිරීම (......)

**15.** පහත දැක්වෙන්නේ සමාගමක් හා සම්බන්ධ කරුණු කිහිපයකි.

A – සමාගමේ අරමුණු
B – කොටස් හිමියන්ගේ අයිතිවාසිකම්
C – සමාගමේ කොටස් ප්‍රාග්ධනය
D – ලියාපදිංචි කාර්යාල ලිපිනය
E – සමාගමේ කළමනාකරණය

ඉහත දැ අතුරෙන් ශ්‍රී ලංකාවේ 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සාංගමික ව්‍යවස්ථාවලියක ඇතුළත් විය යුතු කරුණු පමණක් දක්වා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A, B, E (2) A, C, D (3) B, C, D (4) B, D, E (5) C, D, E (......)

**16.** ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A – රාජ්‍ය ණය කළමනාකරණය
B – මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
C – විදේශ විනිමය කළමනාකරණය
D – මූල්‍ය බුද්ධි සේවා සැපයීම
E – මූල්‍ය පද්ධති අධීක්ෂණය
F – සේවක අර්ථසාධක අරමුදලේ භාරකරු

ඉහත දැ අතුරෙන්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහ බැංකුව විසින් සිදු කරනු ලබන නියෝජිත කාර්යයන් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A, B, C, E (2) A, C, D, F (3) B, C, E, F
(4) B, D, E, F (5) C, D, E, F (......)

**17.** රක්ෂණය කළ හැකි ව්‍යාපාර අවදානමක් සඳහා උදාහරණයක් වන්නේ,
(1) මෝස්තර වෙනස්වීම ය. (2) යන්ත්‍ර ක්ෂය වීම ය.
(3) ව්‍යාපාර අලාභ වීම ය. (4) මුදලේ අගය උච්ඡාවචනය වීම ය.
(5) ණයගැති මුදල් නොලැබීම ය. (......)

**18.** 'සාධ්‍යකයා' යනුවෙන් අදහස් වන්නේ,
(1) ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගස්වා ගනුදෙනුවට අදාළ තැරැව් ගාස්තුවක් ලබාගන්නා පුද්ගලයා ය.
(2) ප්‍රධානියා වෙනුවෙන් තම අභිමතය පරිදි ගනුදෙනු සිදු කිරීම තුළින් කොමිස් මුදලක් උපයා ගන්නා පුද්ගලයා ය.
(3) ප්‍රධානියා සතු භාණ්ඩ ලිඛිතව හෝ වාචිකව ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ ගැනුම්කරුවන්ට අලෙවි කරන පුද්ගලයා ය.
(4) ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිල දී ගැනීමේ දී හෝ විකිණීමේ දී එම ගනුදෙනු තමාගේ නමින් ම සිදු කරන පුද්ගලයා ය.
(5) ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකිණීම සිදු කර එම ණය මුදල් අදාළ පාර්ශ්වයන්ගෙන් එකතු කර දීමට කැපවන පුද්ගලයා ය. (......)

**19.** පහත දැක්වෙන ජාත්‍යන්තර වෙළඳාමට පිවිසීමේ මාර්ග අතුරෙන් **අවම** අවධානමක් ඇති මාර්ගය කුමක් ද?
(1) බද්ධ ව්‍යාපාර (2) අපනයනය
(3) ඒකාබද්ධ වීම (4) අත්පත් කරගැනීම්
(5) සෘජු විදේශ ආයෝජන (FDI) (......)

[හතරවැනි පිටුව බලන්න.

**20.** පහත වගුවේ දැක්වෙන්නේ කළමනාකරණ සංකල්ප කිහිපයක් සහ එයට අදාළ විස්තර කිහිපයකි.

| සංකල්ප | විස්තර |
|---|---|
| (i) අණ කිරීමේ ඒකීයත්වය | A - සංවිධානයක බලතල, කාර්යය සහ වගකීම් බෙදී ගොස් ඇති ආකාරය |
| (ii) විමධ්‍යගත කිරීම | B - සංවිධානයේ ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය තෙක් ගලායන නොබිඳුණු විධාන |
| (iii) පාලන අවකාශය | C - එක් සේවකයකු එක් සුපරීක්ෂකවරයකුට පමණක් වගකිව යුතු බව |
| (iv) සංවිධාන ව්‍යුහය | D - එක් කළමනාකරුවකුට සෘජුව වාර්තා කරනු ලබන සහයකයින් සංඛ්‍යාව |
| (v) නියෝග දීමේ දාමය | E - තීරණ ගැනීමේ බලතල සංවිධානයක ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණයට පැවරීම |

ඉහත දී ඇති සංකල්ප අනුපිළිවෙල අනුව ඊට ගැළපෙන විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, B, E, C, D (2) A, D, E, C, B (3) C, E, A, D, B
(4) C, E, D, A, B (5) E, B, C, D, A (......)

**21.** පහත දක්වා ඇත්තේ කළමනාකරුවකුට බලය ලැබෙන මූලාශ්‍ර කිහිපයකි.

A – නීතිමය බලය
B – දඬුවම් දීමේ බලය
C – ත්‍යාග දීමේ බලය
D – බලපෑම් කිරීමේ බලය
E – විශේෂඥ බලය

ඉහත දැ අතුරෙන් තනතුරට අදාළ බලය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, B, C (2) A, C, E (3) B, C, D (4) B, D, E (5) C, D, E (......)

**22.** නිෂ්පාදන ආයතනයක වාර්ෂික මුළු පිරිවැය සහ මුළු විචල්‍ය පිරිවැය පිළිවෙළින් රු. 360 000 ක් සහ රු. 120 000 කි. ව්‍යාපාරය ඒකක 6 000 ක් අලෙවි කිරීමෙන් ලබාගත් වාර්ෂික ආදායම රු. 300 000 කි. ආයතනයට සමච්ඡේදන ලක්ෂ්‍යය කරා ළඟා වීමට අලෙවි කළ යුතු ඒකක සංඛ්‍යාව වනුයේ,

(1) 4 000 කි. (2) 8 000 කි. (3) 10 000 කි. (4) 12 000 කි. (5) 20 000 කි. (......)

**23.** සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයට අයත් **නොවන** සංරචකය වනුයේ,

(1) සම්බන්ධතා අලෙවිකරණය යි. (2) අභ්‍යන්තර අලෙවිකරණය යි.
(3) කාර්යසාධන අලෙවිකරණය යි. (4) සන්නම් අලෙවිකරණය යි.
(5) සමෝධානිත අලෙවිකරණය යි. (......)

**24.** පහත මූල්‍ය කළමනාකරණ තීරණ අතුරෙන් දිගුකාලීන මූල්‍ය තීරණයක් වන්නේ කුමක් ද?

(1) ව්‍යාපාර නවීකරණ (2) ව්‍යාපාර විවිධාංගීකරණ
(3) ලාභාංශ (4) වෙළඳ තොග
(5) බැංකු අයිරා (......)

**25.** මූල්‍ය වෙළෙඳපොළ උපකරණ කිහිපයක් පහත දැක්වේ.

A – භාණ්ඩාගාර බැඳුම්කර
B – අන්තර් බැංකු ඒක්ෂණ ණය
C – වාණිජ පත්‍රිකා
D – සාංගමික බැඳුම්කර
E – භාණ්ඩාගාර බිල්පත්
F – කොටස්
G – ණයවර ලිපි

ඉහත දැ අතුරෙන්, මුදල් වෙළෙඳපොළට අදාළ උපකරණ පමණක් දැක්වෙන වරණය තෝරන්න.

(1) A, C, D, F (2) A, D, E, G (3) B, C, E, G
(4) B, D, E, F (5) C, D, E, F (......)



PaperKokka.lk

**26.** පහත දැක්වෙන්නේ ආදායම් එකතු කිරීමට සම්බන්ධ මූලධර්ම කිහිපයකි.

A – සමානාත්මතාවය
B – වෙන් කළ නොහැකි බව
C – පහසු බව
D – ප්‍රමාණාත්මක බව
E – නිශ්චිත බව
F – පිරිමැසුම් බව

ඉහත දෑ අතුරෙන්, බදුකරණයට සම්බන්ධ මූලධර්ම පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B, D, F (2) A, C, E, F (3) B, C, D, E
(4) B, D, E, F (5) C, D, E, F (......)

**27.** 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව පාරිතෝෂික දීමනා සඳහා සුදුසුකම් ලැබීමට සේවකයකු එක් සේවා යෝජකයෙක් යටතේ අවම වශයෙන් සේවය කළ යුතු වසර ගණන,

(1) 3 කි. (2) 4 කි. (3) 5 කි. (4) 6 කි. (5) 7 කි. (......)

**28.** පහත දැක්වෙන්නේ සේව්‍ය හා සේවකයින්ට අනුගමනය කළ හැකි කාර්මික ක්‍රියාමාර්ග කිහිපයකි.

A – අකුරට වැඩ කිරීම
B – අතිකාල වැඩ වල නොයෙදීම
C – පිට මං කිරීම
D – වැඩ මගහැරීම
E – වර්ජන ආවරණය කිරීම
F – පිකටිං කිරීම
G – නිෂ්පාදන ස්ථානය මාරු කිරීම
H – සේවය අතහැර ගියා සේ සැලකීම

ඉහත දෑ අතුරෙන්, සේවකයින් සිදු කරන කාර්මික ක්‍රියාමාර්ග වැළැක්වීම සඳහා සේව්‍යන්ට ගත හැකි ක්‍රියාමාර්ග පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, D, E, G (2) A, B, C, H (3) B, D, E, F
(4) C, D, E, F (5) C, E, G, H (......)

**29.** 'පද්ධති මෘදුකාංග' යන්න වඩාත් නිවැරදිව විස්තර කර ඇති ප්‍රකාශය වන්නේ,

(1) පරිගණක දෘඩාංග ක්‍රියාත්මක කිරීමට නිර්මාණය කරන ලද වැඩසටහන් ය.
(2) පරිගණක පද්ධති නියමාකාරයෙන් පවත්වාගෙන යාමට උදව්වන වැඩසටහන් ය.
(3) පරිගණක භාවිත කරන්නන් සඳහා විශේෂිතව සකස් කරන ලද වැඩසටහන් ය.
(4) පරිගණක භෞතික කොටස් හා ඒ ආශ්‍රිත මෙවලම් ය.
(5) පරිගණක වැඩසටහන් ගබඩා කිරීම සඳහා භාවිත කරන මෙවලම් ය. (......)

**30.** පහත වගුවේ දැක්වෙන්නේ තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම හා ඊට අදාළ විස්තර කිහිපයකි.

| ශිල්පීය ක්‍රම | විස්තර |
|---|---|
| (i) තත්ත්ව කව | A - සෑම නිෂ්පාදිතයක්ම දෝෂවලින් තොරව නිෂ්පාදනය වන බවට තහවුරු කිරීම |
| (ii) ශුන්‍ය දෝෂ | B - නිෂ්පාදිතයේ ගුණත්වය තහවුරු කරගැනීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම |
| (iii) තත්ත්ව ආරක්ෂණ | C - නිෂ්පාදන හා එහි ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා භාවිත කරනු ලබන ශිල්පීය ක්‍රම |
| (iv) ගුණත්ව ප්‍රමිති | D - නිෂ්පාදනයේ ගැටලු නිරාකරණය කිරීම සඳහා කුඩා කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කිරීම |
| (v) Six සිග්මා (Six Sigma) | E - ජාතික හෝ අන්තර්ජාතික ප්‍රමිති අනුව භාණ්ඩ නිෂ්පාදනය කිරීම |

ඉහත දැක්වෙන ශිල්පීය ක්‍රම අනුපිළිවෙළ අනුව විස්තර නිවැරදිව ගළපා ඇති වරණය තෝරන්න.

(1) A, B, C, E, D (2) B, C, A, D, E (3) B, E, D, A, C
(4) D, A, B, E, C (5) D, C, E, B, A
(......)

- අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) වාණිජ්‍යය, ..................... හා ..................... යන කොටස් දෙකෙන් සමන්විත වේ.

(ආ) කළමනාකරුවන් ............................ පරිසර බලවේගයක් වන අතර සැපයුම්කරුවන් ............................ පරිසර බලවේගයක් වේ.



PaperKokka.lk

**32.** (අ) ඒබ්‍රහම් මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියට අනුව ආහාරපාන ............................ අවශ්‍යතාවයක් වන අතර පුද්ගල සමාජ පිළිගැනීම ............................ අවශ්‍යතාවයකි.

(ආ) රටක බුන්වත්භාවය ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාව ............................ ස්ථායීතාවය ලෙස ද උද්ධමනය පාලනය කිරීමේ හැකියාව ............................ ස්ථායීතාවය ලෙස ද හඳුන්වනු ලැබේ.

**33.** (අ) සංස්ථාපිත සමාගම්වල කොටස් විකිණීම සඳහා සම්බන්ධ වන්නේ ............................ ආයතන වන අතර මූලික කොටස් නිකුතුවක දී මිල දී නොගත් කොටස් මිල දී ගැනීම සඳහා සම්බන්ධ වනුයේ ............................ ය.

(ආ) පාරිසරික හා සමාජීය ගැටලු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ............................ ව්‍යවසායකත්වය තුළින් ලබාදෙන අතර ............................ ව්‍යවසායකත්වය සංවිධානයක වෙනස්කම් හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාකාරී වේ.

**34.** (අ) සේවක ............................ අරමුදලට සේව්‍ය සේවක දෙපාර්ශ්වයම දායක වන අතර සේවක ............................ අරමුදලට සේවා යෝජකයා පමණක් දායක වේ.

(ආ) නොදන්වා සේවයට නොපැමිණීම සේවක ............................ ලෙස ද නොදන්වා දිගුකාලීනව සේවයට වාර්තා නොකිරීම ............................ ලෙස ද හැඳින්වේ.

**35.** (අ) පෙළඹවීම තුළින් භාණ්ඩ අලෙවි කිරීම ............................ සංකල්පය ලෙස ද, ගනුදෙනුකරුවාට අවශ්‍ය පරිදි වටිනාකම් ජනනය කිරීම තුළින් භාණ්ඩ අලෙවි කිරීම ............................ සංකල්පය ලෙස ද හැඳින්වේ.

(ආ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර, නම සන්නම් 2003 අංක 36 දරණ ............................ දේපළ පනත යටතේ ලියාපදිංචි කළ හැකි අතර එවිට එය ............................ ලකුණ බවට පත් වේ.

**36.** (අ) මූල්‍ය වෙළෙඳපොළ, ............................ හා ............................ වෙළෙඳපොළවලින් සමන්විත වේ.

(ආ) ගෝලීය අන්තර් බැංකු ගනුදෙනු හා ගෙවීම් සේවා ක්‍රියාත්මක කරන සන්නිවේදන ජාලය හඳුන්වන කෙටි යෙදුම ............................ ලෙස ද ශ්‍රී ලංකාව තුළ අන්තර් බැංකු මුදල් හුවමාරු සිදු කරන මාර්ගගත පද්ධතිය හඳුන්වන කෙටි යෙදුම ............................ ලෙස ද හැඳින්වේ.

**37.** (අ) ව්‍යාපාරයක කෙටිකාලීන බුන්වත්භාවය ............................ අනුපාත මගින් හඳුනාගත හැකි අතර ............................ අනුපාත මගින් වත්කම්වල ආයෝජනය හා ඒවායින් ජනිත වන ඉපැයීම් අතර සම්බන්ධතාව හඳුනාගත හැකි වේ.

(ආ) ව්‍යාපාරයේ අනාගත මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මුදල් තක්සේරු කිරීමට ............................ අයවැය භාවිත කරන අතර ව්‍යාපාරයක දිගුකාලීන විභව ආයෝජන සැලසුම් කිරීමට ............................ අයවැය භාවිත කෙරේ.

**38.** (අ) අනුගාමිකයින්ගේ අදහස් සැලකිල්ලට ලක්කර කටයුතු කරන නායකයා ............................ නායකත්ව ශෛලියට අයත් වන අතර එසේ නොකොට තම අභිමතය පරිදි කටයුතු කරන නායකයා ............................ නායකත්ව ශෛලියට අයත් වේ.

(ආ) ව්‍යාපාරයක නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය යෙදවුම් ලබාගැනීම ............................ ක්‍රම කාර්යය සම්පාදන (ප්‍රවාහන හා සැපයුම් සේවා) (Logistics) කටයුත්තක් ලෙස ද නිමැවුම් වෙළෙඳපොළට සැපයීම ............................ ක්‍රම කාර්යය සම්පාදනයට අයත් කටයුත්තකි.

[ඉත්වැනි පිටුව බලන්න.

PaperKokka.lk

**39.** (අ) රබර් අත්වැසුම් නිෂ්පාදන ආයතනයක් රබර් වැවිලි සමාගමක් අත්පත් කරගැනීම .......................... සංයෝජනයට උදාහරණයක් ලෙස ද එම නිෂ්පාදන ආයතනය විසින් අත්වැසුම් අලෙවිකරණ සමාගමක් අත්පත් කරගැනීම .......................... සංයෝජනයට උදාහරණයක් ද වේ.

(ආ) ගබඩාකරණය යනු තොගයක් මිල දී ගත් අවස්ථාවේ හෝ නිෂ්පාදනය කළ අවස්ථාවේ සිට භාවිතයට හෝ විකිණීමට ගන්නා තෙක් ...................... ගැනීමේ සහ .......................... ගැනීමේ ක්‍රියාවලියයි.

**40.** (අ) රාජ්‍ය දෙපාර්තමේන්තු පරිපාලනය මූලිකවම .................. සංග්‍රහය මත පදනම් වන අතර ඒවාහි අරමුදල් පරිපාලනය ..................... රෙගුලාසි මත පදනම් වේ.

(ආ) සන්නිවේදන ක්‍රියාවලියේ දී, යවන්නාගේ අදහස් සම්ප්‍රේෂණය කිරීමට හැකි ආකාරයට පරිවර්තනය කිරීම .......................... ලෙස ද පණිවුඩය ලබන්නා විසින් එය තේරුම්ගත හැකි ආකාරයට පරිවර්තනය කිරීම .......................... ලෙස ද හැඳින්වේ.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **සුදුසු පිළිතුරු** සපයන්න.

**41.** පාරිභෝගිකයකු සතු වගකීම් **හතරක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

**42.** වගකීම් රක්ෂණය යටතේ ලබාගත හැකි රක්ෂණ ඔප්පු වර්ග **හතරක්** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

**43.** ප්‍රවාහන පද්ධතියක මූලිකාංග **හතරක්** ලියන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

**44.** දෙපාර්තමේන්තුකරණය සඳහා යොදාගත හැකි පදනම් **හතරක්** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

**45.** භාණ්ඩ ජීවන චක්‍ර සංකල්පය පදනම් වී ඇති උපකල්පන **හතරක්** දක්වන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

PaperKokka.lk

[අටවැනි පිටුව බලන්න.

**46.** කළමනාකරණ තනතුරක් සඳහා වඩාත් සුදුසු අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා භාවිත කළ හැකි ක්‍රම **හතරක්** නම් කරන්න.


(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**47.** පහත සඳහන් රූප සටහනේ ඇති **A, B, C, D** අක්ෂරවලින් පිළිබිඹු වන එක් එක් නිෂ්පාදන ක්‍රමය නම් කරන්න




**A** – ..........................................................................................

**B** – ..........................................................................................

**C** – ..........................................................................................

**D** – ..........................................................................................

**48.** ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** ලියන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**49.** වලාකුළු පරිගණකමය (Cloud Computing) තාක්ෂණය භාවිත කිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන වාසි **හතරක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(3) ..........................................................................................

(4) ..........................................................................................

**50.** පහත සඳහන් තාක්ෂණ ක්‍රම ව්‍යාපාරිකයකුට භාවිත කළ හැකි අවස්ථාවක් බැගින් සඳහන් කරන්න.

(1) කෘත්‍රිම බුද්ධිය (AI) : ..........................................................................................

(2) ක්ෂණික ප්‍රතිචාර කේතය (QR Code) : ..........................................................................................

(3) ගෝලීය තැන් සෙවුම් පද්ධතිය (GPS) : ..........................................................................................

(4) පරිගණක ආධාරක නිර්මාණ (CAD) : ..........................................................................................

* * *

PaperKokka.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

**32 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** 'සුවපා' සමාගම දේශීය අමුද්‍රව්‍ය භාවිත කරමින් පාවහන් නිෂ්පාදනය කර ඒවා දේශීය හා විදේශීය වෙළෙඳපොළවලට අලෙවි කරයි. වර්තමානයේ රට තුළ පවතින ආර්ථික අර්බුදය සහ ආනයන සීමා කිරීම් හමුවේ මෙම සමාගම අවදානම් රැසකට මුහුණ දී සිටී. එමෙන් ම, නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාමට විදුලිය හා ඉන්ධන අර්බුදය බලපා ඇත. තව ද, පාවහන් නිෂ්පාදනය තුළින් ඇතිවන අපද්‍රව්‍ය බැහැර කිරීමේ හා කළමනාකරණය කිරීමේ ගැටලුවකට ද සුවපා සමාගම මුහුණ දෙමින් සිටී.

(i) (අ) ව්‍යාපාරයක 'අවදානම' යනුවෙන් කුමක් අදහස් කෙරේ ද? (ලකුණු 02 යි)
(ආ) සුවපා සමාගමට බලපා ඇති අවදානම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) රජය විසින් නිමි පාවහන් ආනයනය සීමා කිරීම සුවපා සමාගමට බලපාන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)
(ආ) නිමි පාවහන් ආනයනය සීමා කිරීම තුළින් පාරිභෝගිකයන්ට සිදුවන අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) විදුලි අර්බුදය හා සම්බන්ධ පිරිවැය කළමනාකරණය කිරීම සඳහා සුවපා සමාගමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)
(ආ) මෙම සමාගමට අපද්‍රව්‍ය කළමනාකරණය කළ හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) ඉහත සිද්ධිය හා සම්බන්ධ සාර්ව පරිසර ප්‍රවණතා **දෙකක්** හඳුනාගෙන, ඒවා මෙම සමාගමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) සුවපා සමාගමේ කළමනාකරණය අනාගතයේ දී පාවහන් නිෂ්පාදනය නතර කිරීමට අදහස් කළහොත්, ඒ තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදුවිය හැකි බලපෑම් **දෙකක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** (i) 'ලෝකයේ බහුලව පවතින ව්‍යාපාර ක්‍රමයක් ලෙස වරලත් ව්‍යාපාර දැක්විය හැක.'
(අ) මෙම ව්‍යාපාර ක්‍රමය තුළින් වරලත්හිමියාට අත්වන වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) මෙම ව්‍යාපාර ක්‍රමය තුළින් වරලත්ලාභියාට අත්වන අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ආචාරධර්ම සහ නීති අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ආ) තිරසර සංවර්ධනයේ මූලික පදනම් **දෙකක්** උදාහරණය බැගින් සපයමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) 1890 හවුල් ව්‍යාපාර පනතට අමතරව, ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර සඳහා බලපාන වෙනත් පනත් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ආ) සමූපකාර ව්‍යාපාර ක්ෂේත්‍රයේ දැකිය හැකි ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) සීමාසහිත පොදු සමාගම්වල වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) ශ්‍රී ලංකාවේ 2007 අංක 17 දරණ සමාගම් පනතට අනුව ලැයිස්තුගත සහ පුද්ගලික සමාගම්වල ව්‍යාපාර නාමයන්හි අන්තර්ගත විය යුතු අනිවාර්ය නියමය දක්වන්න. (ලකුණු 02 යි)

(v) 'රාජ්‍ය අංශයේ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම' යන්න නිර්වචනය කර, ඒ තුළින් රජයක් ඉටු කර ගැනීමට බලාපොරොත්තුවන අරමුණු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

**3.** (i) (අ) චෙක්පතක් රේඛනය කළ හැකි පාර්ශ්ව **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) චෙක්පතක් 'ගනුදෙනු කළ නොහැක' ලෙස රේඛනය කිරීමෙන් ඇතිවන නෛතික බලපෑම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ගිණුම් හිමියකුට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) තුළින් ලබාගත හැකි සේවා **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) පහත සඳහන් දෑ අතුරෙන් **එකක්** පමණක් කෙටියෙන් විස්තර කරන්න.

(1) විශාල දත්ත (big data)

(2) විද්‍යුත් මුදල් (e-money) (ලකුණු 02 යි)

(iii) (අ) ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා රජය මගින් ලබාදෙන මූල්‍ය නොවන සේවා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'නිර්මාණශීලීත්වය ව්‍යවසායකයකු සතු මූලික ගුණාංගයකි.' මෙම ගුණාංගයෙහි වැදගත්කම උදාහරණයක් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iv) 'ව්‍යවසායකත්වය රටක සංවර්ධනයේ ජීවනාලිය ලෙස පිළිගැනේ.' එසේ පිළිගැනීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා සහ මාධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්තමානයේ දී මුහුණපාන අභියෝග **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**4.** (i) (අ) ජීවිත රක්ෂණය සහ සෞඛ්‍ය රක්ෂණය අතර පවතින වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) කුලී නිවැසියෙකුට එම නිවස රක්ෂණය කළ හැකි ද යන්න සඳහන් කර, ඔබගේ පිළිතුරට පදනම් වන රක්ෂණ මූලධර්මය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) කාර්ය **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම් වර්ධනය කිරීම සඳහා යොදාගත හැකි උපායමාර්ග **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) පහත දැක්වෙන ක්‍රම කාර්යය සම්පාදන/ප්‍රවාහන හා සැපයුම් සේවා (logistics) මාර්ග අතුරෙන් **එකක්** උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

(1) ආපසු ක්‍රම කාර්යය සම්පාදනය (reverse logistics)

(2) තෙවන පාර්ශ්වීය ක්‍රම කාර්යය සම්පාදනය (3 PL) (ලකුණු 02 යි)

(ආ) විධිමත් ඇසුරුම් හා උපකරණ භාවිතයෙන් ගබඩාකරණයේ දී ව්‍යාපාරිකයකුට ලබාගත හැකි ප්‍රයෝජන **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ පවතින අර්බුදකාරී තත්ත්වය ව්‍යාපාරික හා පාරිභෝගික පාර්ශ්වයන්ට බලපාන ආකාර **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) ව්‍යාපාරිකයකු විසින් සමාජ මාධ්‍යය හරහා සන්නිවේදනය සිදු කිරීමට පක්ෂව සහ විපක්ෂව හේතු **දෙක** බැගින් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

**5.** සමගි ටෙක්ස්ටයිල්ස් ආයතනයේ ප්‍රධාන විධායක ගිහාන්, ව්‍යාපාරයේ උන්නතිය සඳහා නිර්මාණශීලී ව්‍යාපෘති හඳුන්වාදීමේ අවධානම දරන්නෙකි. එසේ ම ඔහු සේවකයන් සමඟ එලදායී සංවාද පවත්වාගන්නා අතර ඉඩ ලද සෑම අවස්ථාවක ම සේවකයින්ගේ උත්සවවලට ආයතනය නියෝජනය කරමින් සහභාගී වේ. තව ද ආයතනයේ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්ව සමඟ ඔහු යහපත් සබඳතා ගොඩනගයි.

(i) (අ) ඉහත සිද්ධිය තුළින් හඳුනාගත හැකි කළමනාකරුවකු සතු ප්‍රධාන කළමනාකරණ භූමිකා වර්ග **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)

(ආ) ඉහත (අ) කොටසෙහි හඳුනාගත් එක් එක් ප්‍රධාන භූමිකාවට අදාළ ව සිද්ධියෙහි ඇතුළත් උප භූමිකා **දෙක** බැගින් ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ගිහාන් සතුව පැවතිය යුතු ප්‍රමුඛ කළමනාකරණ කුසලතාවය නම් කර, ඔබේ පිළිතුරට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ගිහාන් තම ආයතනය සඳහා මෙහෙවර ප්‍රකාශයක් පිළියෙල කිරීමට අදහස් කරන්නේ නම් එහි ඇතුළත් විය යුතු සංරචක **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

[තුන්වැනි පිටුව බලන්න.

(iii) 'ගිහාන් සේවක අභිමුඛ නායකයකු ලෙස සේවකයන් අතර ප්‍රචලිත ය.'

(අ) 'සේවක අභිමුඛ නායකත්ව ශෛලිය' නිර්වචනය කර, එහි ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ගිහාන් තීරණ ගැනීමේ අධිකාරිත්වය විමධ්‍යගත කිරීමට අදහස් කරයි නම් ඒ තුළින් ව්‍යාපාරයට අත්වන ප්‍රතිලාභ **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) පහතින් දැක්වෙන්නේ සමගි ටෙක්ස්ටයිල්ස්හි යෙදවුම් හා නිමැවුම් වලට අදාළ දත්ත කිහිපයකි.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | - | ඒකක 5 000 |
| ශ්‍රමය | - | පැය 2 500 |
| යන්ත්‍ර | - | පැය 4 000 |
| බලශක්ති පිරිවැය | - | රු.150 000 |
| ශ්‍රම පිරිවැය | - | පැයකට රු.100 |
| යන්ත්‍ර පිරිවැය | - | පැයකට රු.25 |
| අමුද්‍රව්‍ය පිරිවැය | - | ඒකකයකට රු.10 |
| මුළු නිමැවුම් | - | ඒකක 300 000 |

(අ) පහත දෑ ගණනය කරන්න.

(1) ශ්‍රම ඵලදායීතාවය (ලකුණු $\frac{1}{2}$ යි)

(2) යන්ත්‍ර ඵලදායීතාවය (ලකුණු $\frac{1}{2}$ යි)

(3) මුළු ඵලදායීතාවය (ලකුණු 01 යි)

(ආ) යන්ත්‍ර ඵලදායිතාවය වර්ධනය කර ගැනීම සඳහා ව්‍යාපාරයට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) ගිහාන්ගේ ව්‍යාපාරය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පාලන ක්‍රියාවලියට ඇතුළත් කළ යුතු පියවර නම් කර, ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** රසාංජලී ආයතනය තත්ත්වයෙන් උසස් බිස්කට් නිෂ්පාදනයේ නියැලී සිටී. මෙම ආයතනයට අලුතින් බඳවාගත් අලෙවිකරණ කළමනාකරු විසින් වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීමේ සහ අලෙවි ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව ඉහළ කළමනාකරණයට අවධාරණය කරයි. තව ද, මෙම නිෂ්පාදන සඳහා යෝග්‍ය ඇසුරුමක අවශ්‍යතාවය ද පෙන්වා දෙයි.

PaperKokka.lk

(i) (අ) සඵලදායී වෙළෙඳපොළ ඛණ්ඩනයක් සඳහා තිබිය යුතු අවශ්‍යතා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) වෙළෙඳපොළ ඛණ්ඩනය කිරීම තුළින් ව්‍යාපාරයට ලබාගත හැකි වාසි **දෙකක්** උදාහරණ සහිත ව සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) බිස්කට් සඳහා ඇසුරුමක් නිර්මාණය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) බිස්කට් සඳහා අව-අලෙවිකරණයක් (de-marketing) පවතී නම් එය මගහරවා ගැනීම සඳහා අලෙවිකරණ කළමනාකරුවකුට යොදාගත හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) භාණ්ඩ වර්ගීකරණයට අනුව බිස්කට් අයත් වන්නේ කුමන භාණ්ඩ වර්ගයට දැයි දක්වා, ඊට වඩාත් ගැළපෙන බෙදාහැරීම් උපායමාර්ගය හා ප්‍රවර්ධන උපායමාර්ගය හේතු සහිතව දක්වන්න. (ලකුණු 04 යි)

(iv) (අ) භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම තුළින් ආයෝජකයකුට ලැබෙන වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂ බැංකු අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(v) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළ වැදගත් වීමට හේතු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**7.** (i) (අ) 'ප්‍රාග්ධන අයවැයකරණය' යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'මූල්‍ය සම්පාදනයේ දී ව්‍යාපාරයකට බාහිර මූල්‍ය මාර්ග වලට වඩා අභ්‍යන්තර මූල්‍ය මාර්ග වාසිදායක වේ.' මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුර සනාථ කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සංචේතන කළමනාකරණය ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවකයකු විසින් විනය විරෝධී ක්‍රියාවක් සිදු කළහොත් සේවා යෝජකයකුට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) මානව සම්පතෙහි ඇති විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'සේවක පරිවාස කාලය' යන්න නිර්වචනය කර, ඒ තුළින් සේවා යෝජකයාට සහ සේවකයාට ඇති වන වාසිය බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) 'සෑම රැකියාවක් ම මූලිකාංග තුනකින් සමන්විත වේ.'

(1) එම මූලිකාංග **තුන** නම් කරන්න. (ලකුණු 01 යි)

(2) ඔබ හඳුනාගත් මූලිකාංගවල ඇති අන්තර් සම්බන්ධතාවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 01 යි)

(ආ) මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය කිරීමේ දී සලකා බැලිය යුතු අභ්‍යන්තර සාධක **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(v) (අ) සාධාරණ හේතුවක් නොමැතිව සේවකයකු සේවයෙන් ඉවත් කළ බව කම්කරු විනිශ්චය සභාවකින් තීන්දු කළහොත් එම සේවකයාට ලබාගත හැකි සහන **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ආයතනයක් විසින් නියමිත පරිදි වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රම (OHS) භාවිත නොකිරීම තුළින් ව්‍යාපාරයට සිදුවන අහිතකර බලපෑම් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**8.** (i) (අ) 'තොරතුරු විවිධ නිර්ණායක අනුව වර්ග කළ හැක.' ස්වභාවය අනුව තොරතුරු වර්ග සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) තොරතුරු පද්ධතියක කාර්ය **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) (අ) පද්ධති මෘදුකාංග හා යෙදවුම් මෘදුකාංග අතර ඇති වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)


(ආ) ආලෝක සමාගම තම සේවක ශ්‍රේණි සඳහා යෝග්‍ය වන තොරතුරු පද්ධති පිළිබඳව සලකා බලමින් සිටී. පහත සඳහන් එක් එක් ශ්‍රේණි සඳහා යෝග්‍ය තොරතුරු පද්ධතිය නම් කරන්න.

1. ඉහළ කළමනාකරණය
2. මධ්‍ය කළමනාකරණය
3. තාක්ෂණ නිලධාරී
4. ලිපිකරු

(ලකුණු 02 යි)

(iii) (අ) ව්‍යාපාර කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) 'විද්‍යුත් තැපැල් (email) ලිපිනයක් උපාංග කිහිපයකින් සමන්විත වේ.' පහත දැක්වෙන විද්‍යුත් ලිපිනයෙහි ***A*** හා ***B*** යන ස්ථානවලට අදාළ සුදුසු පදය ලියන්න. (ලකුණු 02 යි)




(iv) (අ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීම තුළින් ව්‍යාපාරිකයකුට ලබාගත හැකි වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර සැලැස්මෙහි අන්තර්ගත විධායක සාරාංශය පිළියෙල කිරීමේ ප්‍රධාන අරමුණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) ව්‍යාපාර සැලැස්මෙහි අඩංගු මූල්‍ය සැලැස්ම ව්‍යාපාරිකයකුට වැදගත්වන අවස්ථා **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී පාරිසරික ඇගයීමක් සිදු කිරීමේ අවශ්‍යතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

PaperKokka.lk